# රනිල් දිනනවාමයි - 2024

## අස්වණු පතා දිය බඳිමු - වක්කඩවල් වහමු - කක්කුටු බෙණ වලට පෙර

රටේ අති මහත් බහුතරය රනිල්ට තමයි පුළුවන් කියති. සජිත්ට පුළුවන් බෙදීම විතරයයිද, අනුර පුළුවන් කයිය විතරයි ද කියති. ඒ නිසා රනිල්ට ජයගත හැක. ජයගත යුතුමය. එම ජය සහතික කරගැනීමට සහයක් ලෙස ලිවීමට අදහස් කරන ලිපි පෙළක මුල් ලිපියයි මෙය.

කෙසේ වුවත්, රනිල්ට තමයි පුළුවන් කියන සියල්ලන්ම ස්වේච්චාවෙන් පෝලිමේ ගොස් රනිල්ට ඡන්දය දෙනු ඇතැයි සිතන්නේ නම් එය මෝඩ කමකි. වෙනත් වැඩකාරයෙක් ගැන කියනා කෙනෙක් නැත. එහෙත් සැලසුම් කරන්නන්, ක්‍රියාකාරීන්, සාමාජිකයන් හා ආධාරකරුවන් ගෙන් පිරී ඇති, මනා ලෙස සංවිධාන ගත වූ විරුද්ධ පක්ෂ දෙකක් ඇත. එම පක්ෂ දෙකට සාපේක්ෂව යූඑන්පිය දුර්වල බව පිළිගත යුතුය. සටනක දී තම ශක්තීන් ගැන නිසි තක්සේරුවක් නොමැති නම් නම් විනාශයට මුල එයම වෙනු ඇත.

ඒ නිසා එජාපයේ සැබෑ ශක්තීන් හා දුර්වල ස්ථාන හඳුනා ගැනීම ඉතා වැදගත් වනු ඇත. මෙම ලිපිය සකස් කරන්නේ ඒ සඳහා යම් උත්සාහයක් දැරීම සඳහාය. විශේෂයෙන්, ඡන්ද ලබාගැනීමට විශාල ලෙසින් බාදා විය හැකි / හානි වියහැකි, අවස්ථා / ප්‍රදේශ හඳුනා ගැනීමට හා ඒවා පෙන්වා දීමට දරන උත්සාහයකි මේ.

කෙසේ උවත් සිදුවිය හැකි විශාල හානි (වක්කඩවල්) පෙන්වා දීම මිස, කලයුතු ප්‍රතිකර්ම මෙහි දක්වා නොමැත. මන්ද ප්‍රතිකර්ම ස්ථානෝචිතව හා රහසිගතව කලයුතු නිසාය.

වැඩිම වාසිය හෝ අවාසිය ලැබීමට ඉඩ ඇත්තේ අධික ඡන්ද සංඛ්‍යාවක් ඇති දිස්ත්‍රික්ක වලිනි. ඒ අනුව ලංකාවේ වැඩිම ලි.ප. ඡන්ද ඇති දිස්ත්‍රික්ක හඳුනා ගෙන, එය පදනම් කොට ගෙන කරන ලද සමීක්ෂණ ද ඇතුලත් ක්‍රියාදාමයකින් සොයා ගත් දේ මෙහි සටහන් තබමි.

### පියවර 01 / වගු අංක 02

### දශ ලක්ෂය ඉක්මවන ලියාපදිංචි ඡන්ද දායකයන් සිටින දිස්ත්‍රික්ක

| | දිස්ත්‍රික්කය | ලියාපදිංචි ඡන්ද | ආසන | පත්වන මංත්‍රීන් | භූමිප්‍රමාණය ව.කි.මී./ ව.සැ | ප්‍රා.ලේ. කොට්ඨාශ | ග්‍රා. නි. කොට්ඨාශ |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගම්පහ | 1804102 | 14 | 18 | 1386.6 / 535 | 13 | 1177 |
| 2 | කොළඹ | 1744208 | 17 | 19 | 699 / 270 | 13 | 577 |
| 3 | කුරුණෑගල | 1396290 | 14 | 15 | 4816 / 1850 | 30 | 1610 |
| 4 | මහනුවර | 1173302 | 13 | 12 | 1906 / 750 | 20 | 1188 |
| 5 | කළුතර | 1004120 | 08 | 10 | 1598 / 616 | 14 | 762 |
| | එකතුව | 7122023 | 66 | 74 | | | |
| | % | 39% | 39% | 33% | | | |

**ඉහත සඳහන් දිස්ත්‍රික්ක අතරින් ජනපති රනිල්ට වැඩිම හානිය විය හැකි දිස්ත්‍රික්කය කුරුණෑගල බව පෙනී යයි. ඒ අනුව මින් පසු කරුණු දැක්වෙනු ඇත.**

## කුරුණෑගල හෙවත් සත් කෝරළය ( දෙමළ හත්පත්තුව ඉවත්කල )

පළමුව දැක්වීමට ඇත්තේ අභ්‍යන්තර කරුණු වේ.

ඉතා සංශිප්තව හා හොඳින් වැටහෙන ලෙසට පවසන්නේ නම්,

**රනිල්ගේ හතුරෙකු වූ / වන සජිත් ප්‍රේමදාස හම්බන්තොට දිස්ත්‍රික්කයේ දී එජාපයට කල විනාශයට වැඩි විනාශයක්, රනිල්ගේ හිතමිතුරකු වන අකිල කාරියවසම් ගේ නායකත්වය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දී එජාපයට සිදුව ඇති බව කිව හැක. (හේතු සාධක මෙම ලිපියෙන් දැක්වීමට අදහස් නොකරමි. )**

**වගු අංක 01 හි** දත්ත අනුව කුරුණෑගල තිබෙන වැදගත්කම හා විශාලත්වය පැහැදිලි වනු ඇත. විධිමත් සමීක්ෂණයක් කරන්නෙකුට පැහැදිලි වන වැදගත් කරුණු බොහෝය. විෂම දේශගුණික තත්ත්වයන් එක් උදාහරණයකි. නමුත් දේශපාලනික අරමුණු උදෙසා විපරමින් බලන (ඡන්ද වැඩේ දන්නා) කෙනෙකුට දැකිය හැකි දේ ඊට වඩා බොහෝ වැඩිය.

*මෙතරම් ජයග්‍රාහී අවස්ථාවක / ඡන්දයක් එළිපත්තේ තිබෙන මේ අවස්ථාවක තෘප්තියෙන්, ජයග්‍රාහී මනසින්, සිටින යූඑන්පී කාරයෙක් සත් කෝරළයෙන් සොයා ගැනීම අර ‘‘අබ කේස් එක’’ටත් වඩා අමාරු වැඩකි.

*සටන දිනවීමට තෝරා ඇති බ්‍රිගේඩියර්ලාගේ සිට කෝප්‍රල්ලා දක්වා ඇත්තේ නුපුහුණු අය වෙති. සටන් බිම හුරු, වැඩ පෙන්වා ඇති කැප්ටන්ලා, මේජර්ලා බිලට් ඇතුලේ ඕම් ගසති. සැන්ඩ්හර්ට් පුහුණුව ඇති අණ දෙන නිළධාරියෙකු යටතේ මෙසේවීම පුදුමයකි. සැපයුම් ඒකකයක් ගැන දන්නා කෙනෙක් නැත. පොඩි ඔපරේෂන් එකකට ගියත් වෙහිකල් එකට, කෑම පැකට්ස් ටිකට සාජන්ගේ පොකට් එකේ සරණ පමණය. කාන්තා බලකාය ගැන කතා කරලා වැඩක් නැත. සැබෑ යුද්ධයේ යුද්ධකර තිබුණත්, මේ බ්‍රිගේඩ් එකේදී ඒවා නතින් ය. කෙසේ හෝ මෙහි සියලු අංශයන් දුර්වල බව කිව හැක.

කුරුණෑගල පෙරමුණේ ජය මෙම සටනට ඉතා වැදගත් යයි සේනාධිනායකතුමා, ප්‍රමුඛ කාර්යභාර නිළධාරීන්, උපදේශකවරුන් හෝ අඩු තරමින් ඔහුගේ පෞද්ගලික හිතවතුන් හෝ සිතන්නේ නම්,

**වහ වහා කලයුතු කාර්යයන් කිහිපයක් ඇත.**

*වහාම ඔත්තු සේවා සේවා කීපයක් යොදවා කරන නිසි සොයා බැලීමකින් ‘‘සරත් අබේසිංහ’’ කියන දේ ඇත්තද, බොරුද සොයා ගැනීම.

* වඩා වැඩි අවබෝධයකින් යුතු පිරිසක් සමඟ එක්ව කලයුතු දේ හඳුනා ගැනීම.

*අවශ්‍ය පරිපාලන  වෙනස්කම් හා පුද්ගල ආදේශක තීරණය කිරීම හා කලයුතු සියල්ල වහා ඉටු කිරීම.

**මූලිකව කලයුතු කාර්යයන්ට පහතදේ ඇතුලත් විය යුතුයයි සිතමි.**

- ශක්තිමත් නිසි බලධාරියෙක් (බාහිර අයෙක්)  දිස්ත්‍රික්කයට පත්කිරීම.
- දිස්ත්‍රික් කළමනාකරණ  කමිටුව හා මෙහෙයුම් මධ්‍යස්ථායක් ස්ථාපනය.
- අනෙකුත්  පක්ෂ, කණ්ඩායම් හා පුද්ගලයන් (රනිල් දිනවමු කියන) සමග සම්බන්ධතාව  හොඳින් පවත්වා ගතහැකි යාන්ත්‍රණයක් වහා ස්ථාපනය.
- ක්‍රියාකාරීන්ට අවශ්‍ය කරන සියලු සම්පත් ලබාදීම.
- මෙම සුවිසල් දිස්ත්‍රික්කයට එක් ප්‍රභල පාර්ලිමේන්තු  අපේක්ෂකයෙක් පමණක් ප්‍රමාණවත් නොවන නිසා තවත් දෙදෙනෙකුවත් සොයා පත් කිරීම. (සමාජ - සංස්කෘතික හා භූගෝලීය සාධක අනුව)
- දිස්ත්‍රික්කයේ භූගෝලීය කළාප 3 ට සුදුසු වන ලෙසින් නායකයන් යෙදවීම.
- කාන්තා නායකත්වක් හා බල මුළුවක් ගොඩ නැගීම.(දැනට ඉතා දුර්වලය)
- මුස්ලිම් නායකත්වයක් හා සංවිධානයක් ගොඩනැගීම.
- දෙමළ ජාතිකයන් (වතු ප්‍රධාන) ගැන සිතීම හා නායකයින් හඳුනා ගැනීම.

**මෙම කාර්යයන් සියල්ල හොඳින් හා ඉක්මණින් ඉටු කලහොත්, කුරුණෑගල දිස්ත්‍රික්කය ජයගත හැක. නැතිනම් 350000ක පමණ වැඩි ඡන්ද ප්‍රමාණයකින් පරාජය වීමේත්, සමහරවිට සමස්ත පරාජයක ලොකුම කොටස්කරුවා වීමේත් දුක දරාගන්නට කුරුණෑගල යූඑන්පීකාරයින්ට සිදුවෙනු නියතය.**

**වගු අංක 02**

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ පැරණි කළාප තුල ආසන (14 ) බෙදී ඇති ආකාරය**

| කළාපය | ආසනය 1 | ආසනය 2 | ආසනය 3 | ආසනය 4 | ආසනය 5 |
|---|---|---|---|---|---|
| වන්නි හත්පත්තුව | 108 ගල්ගමුව | 109 නිකවැරටිය | 110 යාපහුව | 111 හිරියාල | - |
| කුරුණෑගල | 112 වාරියපොල | 119 කුරුණෑගල | 121 දොඩම්ගස්ලන්ද | 120 මාවතගම | 118 පොල්ගහවෙල |
| කුලියාපිටිය | 114 බිංගිරිය | 113 පඩුවස්නුවර | 116 කුලියාපිටිය | 115 කටුගම්පොල | 117 දඹදෙනිය |

**වගු අංක 02** හි දිස්ත්‍රික්කයේ ආසන කළාප අනුව වෙන්කර දක්වා ඇත. මේ ආකාරයට වෙන් කොට බැලිය යුත්තේ ඒ ඒ කළාපයන්ට බලපාන ගැටළු වෙන වෙනස් හෙයිනි. විශේෂයෙන් වන්නි හත්පත්තුව වියලි දේශගුණයක් ද ඇති, වන අලි තර්ජන පවා බහුල දුෂ්කර ප්‍රදේශයක් වේ. එසේම සුවිසල් ආසන හතරකි. මෙම කළාපයට නිසි දේශපාලන නායකත්වයක් එජාපයෙන් ලැබෙන්නේ ද? මෙය විශේෂයෙන් මතක තබාගත යුතුව ඇත.

කුලියාපිටිය කළාපයේ, කුලියාපිටිය ආසනයේ සිටින දිස්ත්‍රික් නායකවරයාත්, එම කළාපයේම කටුගම්පල අසංක පෙරේරාත් (නැවත පැමිණි) හැරුනුවිට වෙනත් කැපී පෙනෙන නායකයින් මේ දිස්ත්‍රික්කයේ නැත කීම අනෙක් ආසන සංවිධායකවරුන්ගේ අමනාපයට හේතුවක් නොවනු ඇත. පක්ෂයක ඡන්ද පදනම රැකෙන්නේත් ආසන මට්ටමේ හා ප්‍රාදේශීය මට්ටමේ නායකයන් නිසාය. එවැන්නන් නැත යනු ඡන්ද නැත යන්නම වේ.

මේ අනුව ඉදිරි ජනපතිවරණයේ දී දිස්ත්‍රික්කය ජයගැනීමට නම් වෙනත් පක්ෂ වලින් ඡන්ද ලබාගත යුතුය. තරගය ඇත්තේ රනිල් (එජාප), සජිත් (සජබ) හා අනුර (ජවිපෙ) අතර බැවින් ඡන්ද ලබාගත යුත්තේ / හැක්කේ කොතනින්ද? කවර නායකයන් මාර්ගයෙන්ද?

පහත වගුව (අංක 03) මගින් 2015 හා 2020 පාර්ලිමේන්තු මැතිවරණයන්හි දී උපරිම ඡන්ද (මනාප) ලබාගත් මන්ත්‍රීවරුන් දක්වා ඇත.

*ඒ අයගෙන් කීදෙනෙකු රනිල්ට සහයෝගය දැක්වීමට දැනට එක්වී සිටින්නේ ද?

*ඒ ඒ ප්‍රදේශ හා වෙනත් සාධක සලකා එක්කරගත යුතු දැනට මන්ත්‍රීන් කවුරුන්ද?

*නැතිනම් සුදුසු පුද්ගලයින් සොයා ගතයුත්තේ කවර ප්‍රදේශ වලින්ද? කවර අවශ්‍යතා සපිරෙන පරිදි ද?

## වගු අංක 03 - කුරුණෑගල දිස්ත්‍රික් මනාපලාභීන් - 2015 හා 2020 මැතිවරණ

| | **2015 අපේක්ෂක (පො.පෙ.)** | **මනාප** | | **2020 අපේක්ෂක (පො.පෙ.)** | **මනාප** |
|---|---|---|---|---|---|
| 1 | මහින්ද රාජපක්ෂ | 423529 | 1 | මහින්ද රාජපක්ෂ | 527364 |
| 2 | දයාසිරි ජයසේකර | 133532 | 2 | ජොන්ස්ටන් ප්‍රනාන්දු | 199203 |
| 3 | ටී.බී.ඒකනායක | 82789 | 3 | රත්නසේකර | 141991 |
| 4 | අනුර ප්‍රියදර්ශන යාපා | 77057 | 4 | දයාසිරි ජයසේකර | 112452 |
| 5 | ජොන්ස්ටන් ප්‍රනාන්දු | 76174 | 5 | අසංග නවරත්න | 82779 |
| 6 | සාලින්ද දිසානායක* | 54318 | 6 | සමන්ප්‍රිය හේරත් | 66814 |
| 7 | ඉන්දික බණ්ඩාරනායක | 46356 | 7 | ඩී.බී. හේරත් | 61954 |
| 8 | තාරනාත් බස්නායක | 43020 | 8 | අනුර ප්‍රියදර්ශන යාපා | 59666 |
| 9 | ඩී.බී. හේරත් | 42719 | 9 | ජයරත්න හේරත් | 54351 |
| 10 | ජයරත්න හේරත් | 34035 | 10 | ශාන්ත බණ්ඩාර | 52086 |
| | * මංජුලා දිසානායක | | 11 | යූ.කේ.සුමිත් | 51134 |

| | 2015 අපේක්ෂක (එ.ජා.ප.) | මනාප | | 2020 අපේක්ෂක (ස.ජ.බ.) | මනාප |
|---|---|---|---|---|---|
| 1 | අකිල විරාජ් කාරියවසම් | 286755 | | | |
| 2 | ජේ.සී.අලවතුවල | 106061 | 2 | ජේ.සී.අලවතුවල | 65956 |
| 3 | ගාමිණී ජයවික්‍රම පෙරේරා | 83346 | | | |
| 4 | නලින් බණ්ඩාර ජයමහ | 80063 | 1 | නලින් බණ්ඩාර | 75631 |
| 5 | එස්.බී. නාවින්න | 76714 | | | |
| 6 | අශෝක් අබේසිංහ | 73184 | 3 | එස්.බී. නාවින්න | 54512 |
| 7 | තුෂාර ඉඳුනිල් | 64359 | 4 | තුෂාර ඉඳුනිල් | 49364 |
| 8 | මොහමඩ් සාහි | 53038 | | | |
| 9 | අචිනි හේරත් මුදියන්සේලාගේ | 51248 | | | |
| 10 | ශමල් සෙනරත් | 47326 | | | |

ලොකු පුටු වල අය, සිහින ලෝක වල දකිමින් සිටි සිහින වලින් බිමට වැටෙද්දී,

පක්ෂය, පාක්ෂිකයා හා නායකයා වෙනුවෙන්,

සැමදා අවදියෙන් සිටි,

සරත් අබේසිංහ, 2024.07.29